# පිහි පූජා කර නිවන් දකින තෙක් මෙ තරම් ආනිසංස ලැබේ යැයි ඔබ සිතුවා ද

## පිළින්දිවච්ඡස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 – පිටු අංක 566 - 567)

හංසවතී නගරයේ ජීවත් වූ දොරටුපාලයෙක් පදුමුත්තර බුදු රජුන්ටත්, ලක්ෂයක් රහතන් වහන්සේලාටත් මැනවින් කළ පිහි පූජා කළා. මේ ඒ පූජාවෙන් උපදින හැම ආත්මයකදී ම ඔහු ලැබූ ආනිසංසයි.

- දක්ෂයෙක් විය.
- කිසි විටෙක සසල නොවීය.
- විශාරදයෙක් විය.
- කෙලෙස්වලට හසු නො වන දැඩි සිතක් ලැබුණා.
- නුවණ හා වීර්ය ලැබුණි.
- කෙලෙස් නැති කිරීමේ සියුම් නුවණක් ලැබුණි.
- අවසාන ආත්ම භාවය ලෙස ගෞතම බුදු සසුනේ පැවිදි ව සියලු කෙලෙස් නසා පිරිනිවී සැනසුණි.